

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2022

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

இலங்கை தேசிய புலமைச் சொத்து அலுவலகம்

National Intellectual Property Office of Sri Lanka

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2022

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

රා.මූ.ව. 02/2020 මාර්ගෝපදේශ අංක 14 හා රා.මූ.ව. 01/2020 මාර්ගෝපදේශ අංක 05 ආකෘති අනුව මෙම වාර්තාව සකස් කර ඇත.

CM - 039229 - 16 (2023/11) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආයතනයේ නම: ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

අන්තර්ගතය

	පිටු අංකය
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ	1-8
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	9-26
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	27-51
පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක	52
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	53-54
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	55-59
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	60-73
පරිච්ඡේදය 08 - 2022 වර්ෂය තුළ සුවිශේෂී සිදුවීම්	74-75

1. ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පද්ධතිය පරිපාලනය කිරීම සම්බන්ධ බලය පැවරී ඇත.

ඕනෑම රටක සමස්ත ආර්ථික සංවර්ධනයේ දී, විශේෂයෙන් දැනුම ප්‍රධාන වශයෙන් සක්‍රීය සහ නිසැක වශයෙන්ම වැදගත් වන වර්තමාන සන්දර්භය තුළ බුද්ධිමය දේපළ අත්‍යවශ්‍ය සහ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. මානව ප්‍රයත්නයන් ක්‍රියාත්මක වන සෑම ක්ෂේත්‍රයක් සඳහාම ආයෝජන, නවෝත්පාදන හා නිර්මාණශීලී ක්‍රියාකාරිත්වය, තාක්ෂණ හුවමාරුව සහ දැනුම් ප්‍රවාහයේ අවශ්‍යතාව ඉතිහාසයේ කවර කලකටත් වඩා වර්තමානයේ දී ශ්‍රී ලංකාව ද අත් විඳිමින් පවතී. සමාලෝචනයට භාජනය කරනු ලබන 2022 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පරිපාලනය සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කෙරෙනු ඇත.

එයටම ආවේණික සුවිශේෂී ලක්ෂණ සහිත වන බුද්ධිමය දේපළ වනාහි එක් දේපළ ආකාරයකි. මානව බුද්ධිය මෙහෙයවා සිදුකරන නිර්මාණාත්මක කාර්යය සඳහා නීතිමය වශයෙන් බලාත්මක කළ හැකි අයිතිවාසිකම් කාණ්ඩය බුද්ධිමය දේපළ ලෙස සැලකේ. සාහිත්‍ය, කලා හෝ විද්‍යාත්මක කාර්යයන්, ප්‍රාසාංගික කලා ශිල්පීන්ගේ රඟ දැක්වීම්, හඬ තැටි, විකාශය කිරීම්, නව නිපැයුම්, කාර්මික සැලසුම්, වෙළඳ ලකුණු, සේවා ලකුණු, වාණිජ නම් සහ තනතුරු, අසාධාරණ තරඟයට එරෙහිව ආරක්ෂාව, භූගෝලීය දර්ශක, හෙළිදරව් නොකළ තොරතුරු සහ සංයුක්ත පරිපථ සඳහා වූ පිරිසැලසුම් නිර්මාණ වැනි ක්ෂේත්‍රවලට අදාළ අයිතිවාසිකම් මීට ඇතුළත් වේ. පුද්ගලයන් විසින් හිමිකාරිත්වය දරන අනෙකුත් දේපළ ආශ්‍රිතව දක්නට ලැබෙන සමහර ලක්ෂණ බුද්ධිමය දේපළ සඳහා ද පොදු වේ. උදාහරණයක් ලෙස, බුද්ධිමය දේපළ වත්කමක් වන අතර එයට මූල්‍යමය වටිනාකමක් ද සහිත වේ. අනිත් ඕනෑම ආකාරයක දේපළක් සඳහා මෙන් බුද්ධිමය දේපළ සඳහා ද හිමිකරගැනීම, වෙනත් පාර්ශවයක් වෙත අයිතිය පැවරීම, විකිණීම හෝ බලපත්‍ර ගිවිසුම්ගත වීම ආදිය සිදුකළ හැකි ය. බුද්ධිමය දේපළ හඳුනාගැනීම හෝ එහි භෞතික පරාමිති මඟින් නිශ්චය කරගැනීම හෝ සිදුකළ නොහැකි බැවින් බුද්ධිමය දේපළ යනු අස්පර්ශනීය දේපළකි. එසේ වුව ද, බුද්ධිමය දේපළ ආරක්ෂා කරගැනීම සඳහා එය ප්‍රත්‍යක්ෂ ආකාරයකට හෝ ක්‍රමයකට නිශ්චිතව පළ කළ යුතු වේ.

කාර්මික දේපළ සහ ප්‍රකාශන හිමිකම් වශයෙන් බුද්ධිමය දේපළ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ. එනම්,

1. නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර, වෙළඳ ලකුණු සහ සේවා ලකුණු, කාර්මික සැලසුම් සහ භූගෝලීය දර්ශක අන්තර්ගත **කාර්මික දේපළ** සහ,
2. ශාස්ත්‍රීය හා කලාත්මක කෘති ආවරණය කරන ප්‍රකාශන හිමිකම්, ප්‍රාසාංගික කලාකරුවන්ගේ ශාබ්දික පටිගත කිරීම් හෝ තැටිගත කිරීම්, නිෂ්පාදකයන්ගේ සහ විකාශන ආයතනවල අයිතිවාසිකම් **සම්බන්ධිත අයිතිවාසිකම්** හෝ **ආසන්න අයිතිවාසිකම්** යනුවෙන් හැඳින්වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

වෙළඳපොළ කේන්ද්‍රීය බුද්ධිමය දේපළ පද්ධතියක් දේශය වෙත ළඟාකර දීමේ අභිප්‍රායෙන් යුතුව ගුණාත්මක බව අරමුණු කරගත් ඵලදායී සේවා සපයන ප්‍රධාන පෙළේ රාජ්‍ය ආයතනයක් බවට පත්වීම.

මෙහෙවර

බුද්ධිමය දේපළ නිර්මාණය, ආරක්ෂා කිරීම හා වාණිජකරණය ඔස්සේ ආර්ථික තිරසාරත්වය ප්‍රවර්ධනය කරන බුද්ධිමය දේපළ පද්ධතියක් ස්ථාපනය වීම සහතික කිරීම.


අරමුණු

i. ජාතියේ නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය කිරීම.
ii. වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම.
iii. ආයෝජන ප්‍රවර්ධනය.
iv. පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම සහ දැනුම මූලික කර ගත් ගෝලීය ක්‍රියාකාරීත්වයට ජාතික ආර්ථිකය ඒකාබද්ධ කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සහ සාමූහික සංගම් ලියාපදිංචි කිරීම හා පරිපාලනය කිරීම ඇතුළුව බුද්ධිමය දේපළ පරිපාලනය කිරීම.
- බුද්ධිමය දේපළ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සහ ප්‍රචලිත කිරීම.
- බුද්ධිමය දේපළ විෂය පිළිබඳ දැනුවත් භාවය ප්‍රවර්ධනය කිරීම.
- ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා බුද්ධිමය දේපළ භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම.
- බුද්ධිමය දේපළ ආශ්‍රිත ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකීම සපුරාලීම සහ ඒ පිළිබඳ කලාපීය සහ අන්තර්ජාතික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.
- බුද්ධිමය දේපළ පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා කිරීම.
- ප්‍රකාශන අයිතිය සහ සම්බන්ධිත අයිතිවාසිකම් පිළිබඳ ක්ෂේත්‍රයේ ආරවුල් නිරාකරණය; බුද්ධිමය දේපළ අයිතිවාසිකම් බලාත්මක කිරීමට පහසුකම් සැලසීම.
- බුද්ධිමය දේපළ නියෝජිතයන් ලියාපදිංචි කිරීම සහ පරිපාලනය.

1.4 සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (කොරතුරු හා පරීක්ෂණ)
අධ්‍යක්ෂ (නීති)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (කොරතුරු හා පරීක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ (කොරතුරු හා සන්නිවේදන කාර්යාංශ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (පාලන)
ගණකාධිකාරී
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (නීති)
අභ්‍යන්තර විගණක
පරීක්ෂක
කාර්යාල කාර්ය සහායක
කොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
පරිපාලන නිලධාරී
හාණ්ඩ පරිවර්තක
කළමනාකරණ සේවා නිලධාරී
වියදුරු
සංවර්ධන නිලධාරී

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ



1.5.1 වෙළඳ ලකුණු අංශය පිළිබඳ හැඳින්වීම

බුද්ධිමය දේපළ යටතේ කාර්මික දේපළ ලෙස වර්ගීකරණය කර ඇති වෙළඳ ලකුණු සහ සේවා ලකුණු ලියාපදිංචි කිරීම මඟින් වෙළඳ ලකුණු අංශය ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය තුළ වැදගත් සේවාවක් සපයනු ලබයි.

අධ්‍යක්ෂ (නීති) මෙම අංශයේ ප්‍රධානත්වය උසුලන අතර, සහකාර අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ, බුද්ධිමය දේපළ නිලධාරීන් පස් දෙනෙකු, සංවර්ධන නිලධාරීන් දොළොස් දෙනෙකු හා කාර්යාල සේවක සේවයේ එක් නිලධාරියකු හා බහු කාර්ය සේවා වැඩසටහනෙන් තාවකාලිකව අනුයුක්ත කරන ලද එක් නිලධාරියකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් මෙම අංශයේ කාර්යයන් ඉටු කරනු ලබයි.

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන ප්‍රකාරව වෙළඳ ලකුණක් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පතක් එය ලියාපදිංචිය හා නැවත අලුත් කිරීම දක්වා වූ සංකීර්ණ ක්‍රියාවලියකට භාජනය වන අතර, එම ක්‍රියාවලිය පහත සඳහන් ආකාරයෙන් දැක්විය හැකි ය.

- පනතේ 106-110 දක්වා වගන්ති වලට අනුකූලව අයදුම්පත සම්පූර්ණ කර ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂා කිරීම.
- මූලික ප්‍රධාන වැරදි නොමැති අයදුම්පත්, පනතේ 103 හා 104 වගන්ති යටතේ සෝදිසි පරීක්ෂාවට ලක් කර, ලකුණු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ ලිපි නිකුත් කිරීම.
- පිළිගනු ලැබූ වෙළඳ ලකුණු රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා අදාළ ගැසට් නිවේදන සකස් කිරීම.

- ඒක පාර්ශවීය/ ද්වි පාර්ශවීය විභාග පැවැත්වීම.
- ලකුණ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු, විරෝධතා ගොනු කර නොමැති, අදාළ සුදුසුකම සපුරා ඇති, වෙළඳ ලකුණු ලියාපදිංචිය වෙත යොමු කර ලියාපදිංචි සහතික නිකුත් කිරීම.
- නියමකර ඇති කාල සීමාව තුළ නියමිත ගාස්තු ගෙවූ පසු වසර 10 කට වරක් ලියාපදිංචිය අලුත් කිරීමේ සහතික නිකුත් කිරීම.
- වෙළඳ ලකුණු පැවරුම්, නම/ලිපිනය වෙනස් කිරීම් හා බලපත්‍ර ගිවිසුම් වාර්තා කිරීම.
- බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටීම හා ඒ හා සම්බන්ධ ලියවිලි හා සාක්ෂි ඔවුන් වෙත ලබා දීම සහ වෙළඳ ලකුණු ආශ්‍රිත ගැටලු වලදී අදාළ රජයේ ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- වෙළඳ ලකුණු පිළිබඳ දැනුවත් කිරීම් වලට අදාළ සම්මන්ත්‍රණ/ වැඩමුළු/සැසිවාර/ප්‍රදර්ශන ආදිය සඳහා සහභාගී වීම.
- වෙළඳ ලකුණු වලට අදාළ සංඛ්‍යා ලේඛන හා අනිකුත් දත්ත සැකසීම හා පවත්වාගෙන යාම සහ අවශ්‍ය පාර්ශව සඳහා එකී අදාළ තොරතුරු ලබා දීම.

1.5.2 පේටන්ට් හා කාර්මික සැලසුම් අංශය පිළිබඳ හැඳින්වීම

පේටන්ට් අයදුම්පත් පරීක්ෂා කිරීම, පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීම, කාර්මික සැලසුම් අයදුම්පත් පරීක්ෂා කිරීම හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම යන කාර්යයන් පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. දේශීය හා විදේශීය යන කාණ්ඩ දෙක යටතේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙත ගොනු කරනු ලබන පේටන්ට් හා කාර්මික සැලසුම් අයදුම්පත් පරීක්ෂාව සඳහා මෙම අංශය වෙත යොමු කෙරේ. එසේම ශ්‍රී ලංකාව 1982 සිට පේටන්ට් සහයෝගීතා ගිවිසුමෙහි (PCT) සාමාජික රටක් වන අතර, එම ගිවිසුම යටතේ විදේශීය අයදුම්කරුවන් විසින් මෙරට ලියාපදිංචිය සඳහා ගොනු කරනු ලබන අයදුම්පත් ද මෙම අංශය වෙත යොමු කෙරේ.

මෙම අංශයේ, අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) ලෙස එක් නිලධරයෙක් ද, සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) ලෙස නිළධරයන් දෙදෙනෙක් ද, සංවර්ධන නිලධාරීන් 12 දෙනෙක් ද, එක් කළමනාකරණ සහකාරවරයෙක් ද, එක් කාර්යාල කාර්ය සහයකවරියක් ද සේවය කරනු ලැබේ.

මෙම අංශය පේටන්ට් සහ කාර්මික සැලසුම්වලට අදාළ දත්ත සහ තොරතුරු පවත්වාගෙන යන අතර බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන වලට අනුකූලව අදාළ තොරතුරු සාමාන්‍ය ජනතාව,

විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සහ පාර්ශවකරුවන් වෙත බෙදා හැරීමේ වගකීම ද දරයි.

1.5.3 තොරතුරු තාක්ෂණ අංශය පිළිබඳ හැඳින්වීම

බුද්ධිමය දේපළ ක්‍රියාවලියේ විවිධ පියවර වලට බුද්ධිමය දේපළ කාර්යාලයේ පරිගණක පද්ධතිය වන කාර්මික දේපළ පරිපාලන පද්ධතිය (IPAS) යාවත්කාලීන කිරීම, අයදුම්පත් ගොනු කිරීමේ දී පරිගණක පද්ධතිය හරහා අයදුම්පත් ගොනු කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම, වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම තොරතුරු තාක්ෂණ අංශය යටතේ ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) ප්‍රධානත්වය දරන මෙම අංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරියකුගෙන් හා සංවර්ධන නිලධාරීන් දෙදෙනකුගෙන් සමන්විත වේ.

1.5.4 ආයතන අංශය පිළිබඳ හැඳින්වීම

මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, පුහුණු අවස්ථා ලබා දීම සහ යටිතල පහසුකම් සැපයීම ආදී කාර්යයන් ඉටු කිරීම මඟින් ආයතනයෙහි සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ආයතන අංශය විසින් ද ඉහළ දායකත්වයක් සපයනු ලබයි. පරිපාලන නිලධාරිනිය විසින් අධීක්ෂණය කරනු ලබන මෙම අංශය භාෂා පරිවර්තක නිලධාරියෙකුගෙන්, සංවර්ධන නිලධාරියෙකුගෙන්, කළමනාකරණ සහකාරවරු සිව් දෙනකුගෙන්, රියදුරන් හතර දෙනෙකුගෙන් හා කාර්යාල කාර්ය සහායකවරු දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

1.5.5 ගිණුම් අංශය පිළිබඳ හැඳින්වීම

මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සියලුම ආදායම් ඇස්තමේන්තු සැකසීම, ආදායම් නිසි පරිදි වර්ගීකරණය කොට ගිණුම් ගත කිරීම, කාර්යාලයීය නිලධාරීන්ගේ වැටුප් ගෙවීම හා බුද්ධිමය දේපළ අරමුදලේ කටයුතු, ආයතනික ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාකරණය, ප්‍රසම්පාදන කටයුතු හා බුද්ධිමය දේපළ අරමුදලේ අරමුදල් කළමනාකරණය ගිණුම් අංශය සතු ප්‍රධාන කාර්යයන් වේ. මෙම අංශයේ ගණකාධිකාරී අධීක්ෂණය යටතේ නිලධාරීන් 09 දෙනෙකු හා කාර්යාල කාර්ය සහයක නිලධාරියෙකු සේවයේ නිරත වේ.

1.5.6 සැලසුම් අංශය පිළිබඳ හැඳින්වීම

ආයතනයෙහි දැක්ම සහ මෙහෙවර ප්‍රකාශ වලට අනුකූල වන ලෙසින්, අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා උපායමාර්ග සැලසුම සකස් කිරීමත්, ආයතනික ශක්‍යතාව සහ හඳුනා ගන්නා ලද සංවර්ධන විභවතා මත පදනම්ව, ආයතනයෙහි විශේෂිත අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමත්, එයට අනුකූලව සංවර්ධන ව්‍යාපෘති මෙහෙයවීමත්,

අධීක්ෂණය සහ පසු විපරම් කිරීමත්, ප්‍රගතිය විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීමත්, විශේෂයෙන් ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) වෙත ඉදිරිපත් කළයුතු සංඛ්‍යාලේඛන සහ ප්‍රගති වාර්තා අවශ්‍ය විශ්ලේෂණ සහිතව ඉදිරිපත් කිරීමත්, සේවාලාභී ප්‍රඥප්තිය ආයතනය තුළ ස්ථාපිත කිරීම මඟින් ආයතනය සහ මහජනතාව අතර අවබෝධය සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීමත්, එමඟින් ආයතනික ඵලදායීතාව ඉහළ නැංවීමත්, ආයතනයෙහි මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සහ නිලධාරින්ගේ කාර්යසාධනය හා සම්බන්ධ සැලසුම් සකස් කිරීමත්, ආයතනයේ ඉලක්ක වලට අනුකූලව දේශීය සහ විදේශීය පුහුණු අවස්ථා හඳුනා ගැනීමත්, සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ගෙවීම් කටයුතු වලට අනුකූලව නිර්දේශ ඉදිරිපත් කිරීමත්, ප්‍රසම්පාදන තීරණ ගැනීම සඳහා සහය වීමත්, සැලසුම් අංශයෙහි කාර්යභාරය ලෙස දැක්විය හැකි ය.

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි සැලසුම් අංශය, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) වරයකුගෙන් සහ සංවර්ධන නිලධාරින් දෙදෙනකුගෙන් සමන්විත ඒකකයකි.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

- ✓ රජයේ ඒකාබද්ධ අරමුදල - ශීර්ෂය 299
- ✓ බුද්ධිමය දේපළ අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

- × නැත

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම


මූල්‍ය ප්‍රගතිය

ආදායම

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2022.12.31 දිනට මුළු ආදායම රු.මි.278.57කි. ඉන් 58% ක් බුද්ධිමය දේපළ අරමුදලේ ආදායම් අතිරික්තය ආයෝජනය කිරීම මඟින් ලද පොලී මඟින් රැස්කළ ආදායම වන අතර, ඉතිරි 42% බුද්ධිමය දේපළ පනත යටතේ වන ගාස්තු අය කිරීම් මඟින් ලද ආදායම වේ.

බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන පරිදි, බුද්ධිමය දේපළ පනත යටතේ උපයනු ලබන ආදායම් වලින් 1/3 කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු අතර, 2022.12.31 දින වන විට එකී වර්ෂය සඳහා එසේ බැර කළ මුදල රු.මි.38.97 කි.


ප්‍රස්ථාරය 1 : 2022.12.31 දිනට සමස්ත ආදායම



වියදම

බුද්ධිමය දේපළ අරමුදල පරිපාලන කිරීමේ කටයුතු වෙනුවෙන් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ නිලධාරින්ගේ පුද්ගල පඩිනඩි හා වැටුප් ගෙවීම් සඳහා ශීර්ෂ අංක 299 යටතේ රජය විසින් රු.මි 46.25 ක ප්‍රතිපාදන දරා ඇත. ඉතිරි සියලු වියදම් බුද්ධිමය දේපළ අරමුදල විසින් දරා ඇත. 2022.12.31 දිනට බුද්ධිමය දේපළ අරමුදලෙන් වැය කර ඇති සමස්ත මුදල රු.මි. 65 කි.

ප්‍රස්ථාරය 2 : 2022.12.31 දිනට බුද්ධිමය දේපළ අරමුදලේ සමස්ත වියදම (රු.මිලි.)



2.1 වෙළඳ ලකුණු ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

වගුව - 1 : 2022.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ ලකුණු ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

ක්‍රියාකාරකම්		ඉටු කරන ලද කාර්ය		
		ඇස්තමේන්තු ගත (සංඛ්‍යාත්මකව)	සත්‍ය (සංඛ්‍යාත්මකව)	%
1	වෙළඳ ලකුණු අයදුම්පත් ලැබීම්	10073	9466	94%
2	නවතාවය පිළිබඳ පරීක්ෂා කිරීම්	10073	6414	64%
3	ලකුණු පිළිගැනීම සහ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව ලිපි නිකුත් කිරීම	10073	10877	108%
4	වෙළඳ ලකුණු සම්බන්ධ නිවේදන රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම	9795	5788	59%
5	වෙළඳ ලකුණු ලියාපදිංචි සහතික නිකුත් කිරීම	7450	3643	49%
6	ලියාපදිංචිය අලුත් කළ අයදුම්පත් සංඛ්‍යාව	4333	3473	80%
7	පැවරුම් සටහන් කිරීම	1538	1400	91%
8	නම/ලිපිනය සිදු වන වෙනස් වීම් සටහන් කිරීම	2551	2016	79%


ප්‍රධාන ක්‍රියාකාරකම් 3ක් යටතේ වෙළඳ ලකුණු අංශයෙහි ප්‍රගතිය විශ්ලේෂණය සිදු කර තිබේ.

2.1.1 ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත් හා පරීක්ෂා කළ අයදුම්පත් අතර සංසන්දනය

වගුව - 2 : ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2018	2019	2020	2021	2022
ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව	11483	10385	9593	9947	9466
සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව	6542	10224	12551	4989	6414

ප්‍රස්ථාරය - 3 : ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 2 හා ප්‍රස්ථාරය - 3 මඟින් 2018 සිට 2022 වර්ෂය දක්වා ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව හා පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව අතර සංසන්දනයක් පෙන්නුම් කරයි.

ඉහත ප්‍රස්ථාරය ට අනුව වර්ෂ 2018 සිට 2022 දක්වා වාර්ෂිකව ලැබී ඇති වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාවෙහි ක්‍රමික පසුබෑමක් නිරීක්ෂණය වේ. ඒ අනුව ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව ජාතික ආර්ථිකයෙහි පවතින තත්ත්වයට සංවේදී දර්ශකයක් වන බවත් නිරීක්ෂණය කළ හැකි ය.


පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාවෙහි කැපී පෙනෙන උච්ඡාවචනයක් නිරීක්ෂණය වන අතර, එය ඒ ඒ වර්ෂවල දී ආයතනය තුළ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති හේතුවෙන් ඇතැම් ක්‍රියාකාරකම් කෙරෙහි දක්වන ලද ප්‍රමුඛතාවයෙහි වෙනස් වීම මත ඇතිවන ලද තත්ත්වයක් ලෙස පැහැදිලි කළ හැකි ය.

2.1.2 ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව හා ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව අතර සංසන්දනය

වගුව - 3 : ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2018	2019	2020	2021	2022
ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව	11483	10385	9593	9947	9466
ලියාපදිංචි කළ වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව	5192	14993	5932	3848	3643

ප්‍රස්ථාරය - 4 : ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 3 හා ප්‍රස්ථාරය - 4 මඟින් 2018 සිට 2022 වර්ෂය දක්වා ලැබී ඇති වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව හා ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව අතර සංසන්දනයක් පෙන්නුම් කරයි.


මෙහිදී ද ආයතනය තුළ විශේෂිත ව්‍යාපෘති ක්‍රියාත්මක වීම මත වෙනස් වන ලද ප්‍රමුඛතා සහ කොවිඩ් වසංගත තත්ත්වයෙහි බලපෑම මත සීමා සහිතව ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් මඟින් ජනිත වන ලද ප්‍රතිඵලයන් නිරීක්ෂණය කළ හැකි ය. තවද, වෙළඳ ලකුණු අංශයෙහි කාර්ය මණ්ඩලය තුළ බුද්ධිමය දේපළ නිලධාරීන්ගේ සංඛ්‍යාත්මක අඩු වීම වෙළඳ ලකුණු අංශයෙහි ප්‍රගතිය කෙරෙහි සෘණාත්මක ලෙස බලපෑම් සිදු කර ඇති බව ද මේ අනුව පැහැදිලි කළ හැකි ය.

2.1.3. ලියාපදිංචි කළ වෙළඳ ලකුණු දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කිරීම

වගුව - 4 : ලියාපදිංචි කළ වෙළඳ ලකුණු දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කිරීම

	2018	2019	2020	2021	2022
දේශීය ලකුණු	1998	5250	2442	2734	1850
විදේශීය ලකුණු	3194	9743	3590	2729	1792

ප්‍රස්ථාරය - 5 : ලියාපදිංචි කළ වෙළඳ ලකුණු දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කිරීම



වගුව - 4 හා ප්‍රස්ථාරය - 5 මඟින් 2018 සිට 2022 වර්ෂය දක්වා ලැබී ඇති වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වෙන් කර පෙන්නුම් කරයි.

ඉහත ප්‍රස්ථාරය මඟින් 2018 වර්ෂයේ සිට විදේශීය ඉල්ලුම්පත් සංඛ්‍යාවෙහි ප්‍රමුඛත්වය 2021න් පසු අවසන්ව ඇති බව නිරීක්ෂණය වේ. එමෙන්ම දේශීය හා විදේශීය ඉල්ලුම්පත් දෙවර්ගයෙහිම සාපේක්ෂ අඩු වීමක් නිරීක්ෂණය වේ.

විදේශීය සන්නම් මෙරට තුළ ලියාපදිංචි කිරීම ද දුර්මුඛව ඇති බවත්, මේ අනුව ලැබෙන වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව ජාතික ආර්ථිකයෙහි පවතින තත්වයට සංවේදී දර්ශකයක් බවත් නිගමනය කළ හැකි ය.

2.2 පේටන්ට් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

වගුව - 5 : 2021.12.31න් අවසන් වූ වර්ෂය සඳහා පේටන්ට් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

	ක්‍රියාකාරකම්	භෞතික ප්‍රගතිය (ඉටු කරන ලද කාර්ය)		
		ඇස්තමේන්තු ගත	සත්‍ය	%
1	පේටන්ට් අයදුම්පත් ලැබීම්	575	431	75%
2	අයදුම්පත් හා සම්බන්ධ මූලික පරීක්ෂාව (දේශීය / ජාත්‍යන්තර / පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) යටතේ ගොනු කළ අයදුම්පත්)	575	1058	184%
3	නවතාවය පිළිබඳ පරීක්ෂා කිරීම් (අයදුම්පත පේටන්ට් බලපත්‍රයක් ලබාදීමේ දී සපුරාලිය යුතු අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්දැයි සඳහා පරීක්ෂාව)	960	1211	126%
4	ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ජර්නල් සැකසීම	4	12	300%
5	පේටන්ට් සම්බන්ධ නිවේදන රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම	200	246	123%
6	පේටන්ට් සහතික සකස් කිරීම	200	189	95%
7	ලියාපදිංචිය අලුත් කළ අයදුම්පත් සංඛ්‍යාව	530	563	106%
8	පොදු මහජනතාව සඳහා තොරතුරු සැපයීම/ දේශීය දත්ත සමුදායන් වෙත ප්‍රවේශ වී තොරතුරු ලබා ගැනීම	100	614	614%


ප්‍රධාන ක්‍රියාකාරකම් 3ක් යටතේ පේටන්ට් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය විශ්ලේෂණය සිදු කර තිබේ.

2.2.1 ලැබුණු පේටන්ට් අයදුම්පත් වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව

වගුව - 6 : ලැබුණු පේටන්ට් අයදුම්පත් වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2018	2019	2020	2021	2022
ලැබුණු පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව	603	611	603	539	431
සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව	1059	1117	922	1084	1211

ප්‍රස්ථාරය - 6 : ලැබුණු පේටන්ට් අයදුම්පත් වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 6 හා ප්‍රස්ථාරය - 6 මඟින් 2022 වර්ෂය තුළ ලැබී ඇති පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව හා පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි.

ඉහත ප්‍රස්ථාරය මඟින් 2018 සිට 2022 දක්වා ලැබුණු පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාවෙහි ක්‍රමික අඩු වීමක් නිරීක්ෂණය කළ හැකි ය. මේ අනුව ඉදිරිපත් වන අයදුම්පත් සංඛ්‍යාව රටෙහි ආර්ථික තත්ත්වයට සංවේදී වී ඇති බව උපකල්පනය කළ හැකි ය.


ඉහත ප්‍රස්ථාරය මඟින් වර්ෂ 2020 සිට සිදු කළ සෝදිසි පරීක්ෂණ සංඛ්‍යාවෙහි ක්‍රමික වර්ධනයක් නිරීක්ෂණය වන අතර, ඒ අනුව පේටන්ට් අංශයෙහි පවතින අතපසු වූ කාර්යයන් ප්‍රමාණය ඉදිරි වසර තුළදී ද පූර්ණ වශයෙන්ම යථාවත් කර ගත හැකිවන බවට අපේක්ෂා කළ හැකි ය.

2.2.2. ලැබුණු පේටන්ට් අයදුම්පත්වලට සාපේක්ෂව පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව

වගුව - 7 : ලැබුණු පේටන්ට් අයදුම්පත්වලට සාපේක්ෂව පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව

වර්ෂය	2018	2019	2020	2021	2022
ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	603	611	604	539	431
පේටන්ට බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව	212	175	273	194	189

ප්‍රස්ථාරය - 7 : ලැබුණු පේටන්ට් අයදුම්පත්වලට සාපේක්ෂව පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව



වගුව - 7 හා ප්‍රස්ථාරය - 7 මඟින් 2022 වර්ෂය තුළ ලැබී ඇති පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව හා පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව පෙන්නුම් කරයි.


ඉහත ප්‍රස්ථාරය මඟින් වාර්ෂිකව සංඛ්‍යාත්මකව අඩුවෙමින් පවතින පේටන්ට් අයදුම්පත් ලැබීම් මධ්‍යයෙහි ආසන්න වශයෙන් ඒකාකාර බවක් සහිතව පේටන්ට් බලපත්‍ර ලබා දීමක් නිරීක්ෂණය කළ හැකි ය. පේටන්ට් බලපත්‍ර ලබා දීම සාපේක්ෂව කල්ගතවන ක්‍රියාවලියක් වන බැවින් පෙර වසරෙහි ලැබුණු අයදුම්පත් වලට සාපේක්ෂව නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව සැසඳීමේ දී බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමික වර්ධනයක් නිරීක්ෂණය කළ හැකි වේ. ඒ අනුව පේටන්ට් අංශයෙහි අතපසු වූ කාර්යයන් ප්‍රමාණය ඉදිරි වසර තුළ යථාවත් කර ගැනීමට හැකිවන බව අපේක්ෂා කළ හැකි ය.

2.2.3. පේටන්ට් බලපත්‍ර ලබා දුන් අයදුම්පත් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය

වගුව - 8 : ලියාපදිංචි කළ පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කිරීම

වර්ෂය	2018	2019	2020	2021	2022
දේශීය	64	39	47	66	80
විදේශීය	148	136	226	128	109

ප්‍රස්ථාරය - 8 : ලබා දුන් පේටන්ට් බලපත්‍ර දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය



වගුව - 8 හා ප්‍රස්ථාරය - 8 මඟින් 2018 සිට 2022 වර්ෂය දක්වා ලබා දුන් පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වෙන් කර පෙන්නුම් කරයි.

2020 වන විට උපරිමයකට ළඟා වී තිබූ විදේශ පේටන්ට් අයදුම්පත් ලැබීම ක්‍රමික අඩු වීමක් නිරීක්ෂණය වන අතර, දේශීය අයදුම්පත් සංඛ්‍යාවෙහි සාපේක්ෂ වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව සංකෝචනය වන ලද ජාතික ආර්ථිකය තුළ විදේශ නිර්මාණ කරුවන්ගේ බැහැර වීමක් සහ ඇතිවන නව අවස්ථාවන් සඳහා දේශීය නිර්මාණ කරුවන්ගේ සාපේක්ෂව ඉහළ ආකර්ශනයක් පවතින බව නිගමනය කළ හැකි ය.

2022 වසර තුළ ප්‍රදානය කරන ලද මුළු පේටන්ට් බලපත්‍ර ප්‍රමාණය 189ක් වන අතර ඉන් දේශීය පේටන්ට් ප්‍රදානයන් 80කි. එම සංඛ්‍යාව 2010 වසරින් පසු වසරක් තුළ ප්‍රදානය කරන ලද වැඩිම දේශීය පේටන්ට් බලපත්‍ර ප්‍රමාණය වේ.

2022 වසර තුළ ප්‍රදානය කරන ලද දේශීය පේටන්ට් ප්‍රදාන 80 අතරින් 27ක් 2021 වසර තුළ ලද අයදුම්පත් සඳහාත්, 22ක් 2020 වසර තුළ ලද අයදුම්පත් සඳහාත්, 12ක් 2019 වසර තුළ ලද අයදුම්පත් සඳහාත්, 09ක් 2018 වසර තුළ ලද අයදුම්පත් සඳහාත්, 10ක් 2011-2017 කාලය තුළ ලද අයදුම්පත් සඳහාත් ප්‍රදානය කර ඇත.

තවද, 2022 වසර තුළ ප්‍රදානය කරන ලද පේටන්ට් ප්‍රදානයන් 80 අතරින් ප්‍රදානයන් 41ක් (51.25%) තනි පුද්ගලයින් වෙත ද, ප්‍රදානයන් 24ක් (30%) රාජ්‍ය විශ්ව විද්‍යාල වෙත ද, ප්‍රදානයන් 15ක් (18.75%) ආයතන වෙත ද පිරිනමා ඇත.

2.3 කාර්මික සැලසුම් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

වගුව - 9 : 2022.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා කාර්මික සැලසුම් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය


ක්‍රියාකාරකම්		භෞතික ප්‍රගතිය (ඉටු කරන ලද කාර්යය)		
		ඇස්තමේන්තු ගත	සත්‍ය	%
1	කාර්මික සැලසුම් අයදුම්පත් ලැබීම්	250	159	64%
2	අයදුම්පත් හා සම්බන්ධ මූලික පරීක්ෂාව (දේශීය / ජාත්‍යන්තර අයදුම්පත්)	250	321	128%
3	අයදුම්පත්වල සෝදිසි පරීක්ෂාව	4	151	60%
4	ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ජර්නල් සැකසීම	150	7	175%
5	කාර්මික සැලසුම් සම්බන්ධ නිවේදන රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම	150	176	117%
6	කාර්මික සැලසුම් සඳහා සහතික පත් සැකසීම	250	96	64%
7	ලියාපදිංචිය අලුත් කළ අයදුම්පත් සංඛ්‍යාව	50	121	48%
8	පොදු මහජනතාව සඳහා තොරතුරු සැපයීම/ දේශීය දත්ත සමුදායන් වෙත ප්‍රවේශ වී තොරතුරු ලබා ගැනීම	250	221	442%

2.3.1 ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව

වගුව - 10 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2018	2019	2020	2021	2022
ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව	288	546	281	139	159
සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව	242	449	288	164	151

ප්‍රස්ථාරය - 9 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 10 හා ප්‍රස්ථාරය - 9 මඟින් 2018 සිට 2022 වර්ෂය දක්වා ලැබී ඇති කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව හා පරීක්ෂා කළ කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි.

වර්තමාන ආර්ථික පසුබෑම මත ප්‍රමාණාත්මකව අඩු වී තිබූ කාර්මික සැලසුම් අයදුම්පත් ගොනු කිරීමේ සංඛ්‍යාව 2021 වර්ෂයට සාපේක්ෂව සුළු වර්ධනයක් නිරීක්ෂණය කළ හැකි ය. එසේම ඉදිරිපත් කරන ලද අයදුම්පත් සියල්ලම පාහේ සෝදිසි පරීක්ෂාවට ලක් කර තිබීම මඟින් කාර්මික සැලසුම් අංශය ඉහළ ප්‍රගතියක් වාර්තා කර ඇති බව නිරීක්ෂණය කළ හැකි ය.


තවද, 2022 වර්ෂය අවසාන වන විට ද්විතීයික පරීක්ෂාව සඳහා සුදුසුකම් ලැබූ කාර්මික සැලසුම් අයදුම්පත් අතරින් 2022 දෙසැම්බර් මස ලද කාර්මික සැලසුම් අයදුම්පත් 2ක් හැර අනෙකුත් සියලු අයදුම්පත් සඳහා ද්විතීයික පරීක්ෂාව සිදු කිරීමට කාර්මික සැලසුම් අංශය සමත්වී තිබේ.

2.3.2. ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව

වගුව - 11 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2018	2019	2020	2021	2022
ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව	288	546	281	139	159
ලියාපදිංචි කළ කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව	124	258	151	99	96

ප්‍රස්ථාරය - 10 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කරන ලද අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 11 හා ප්‍රස්ථාරය - 10 මඟින් 2018 සිට 2022 වර්ෂය දක්වා ලැබී ඇති කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව හා ලියාපදිංචි කළ කාර්මික සැලසුම් සංඛ්‍යාව පෙන්නුම් කරයි.

ජාතික ආර්ථිකයෙහි පසුබෑම මත ඉදිරිපත් වන අයදුම්පත් සංඛ්‍යාව පහළ යාම හේතුවෙන් වාර්ෂිකව ලියාපදිංචි කෙරෙන කාර්මික සැලසුම් සංඛ්‍යාව ද පහළ ගොස් ඇති බව මෙමඟින් නිරීක්ෂණය කළ හැකි ය.

2022 වසර තුළ ලියාපදිංචි කරන ලද මුළු කාර්මික සැලසුම් ප්‍රමාණය 96ක් වන අතර ඉන් 81ක් 2020-2022 වර්ෂ තුළ ගොනු කරන ලද අයදුම්පත් වීම විශේෂත්වයකි. ලියාපදිංචි කිරීම් අතුරින් කාර්මික සැලසුම් අයදුම්පත් 13ක් 2019 වසර තුළ ගොනු කරන ලද අයදුම්පත් වන අතර 2019ට පෙර ගොනු කරන ලද අයදුම්පත් ප්‍රමාණය 2කි.


ඒ අනුව කාර්මික සැලසුම් අංශය තුළ අතපසු වූ වැඩ ප්‍රමාණයක් නොපවතින බැවින් ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලබන බව නිගමනය කළ හැකි ය.

2.3.3 ලියාපදිංචි කළ කාර්මික සැලසුම් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය

වගුව - 12 : ලියාපදිංචි කළ කාර්මික සැලසුම් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය

වර්ෂය	2018	2019	2020	2021	2022
දේශීය	86	198	122	54	74
විදේශීය	38	60	29	45	22

ප්‍රස්ථාරය - 11 : ලියාපදිංචි කළ කාර්මික සැලසුම් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය



වගුව - 12 හා ප්‍රස්ථාරය - 11 මඟින් 2018 සිට 2022 වර්ෂය දක්වා ලියාපදිංචි කළ කාර්මික සැලසුම් සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වෙන් කර පෙන්නුම් කරයි.

ඉහත ප්‍රස්ථාරය අනුව වාර්ෂිකව ලියාපදිංචි කරනු ලබන සමස්ත කාර්මික සැලසුම් සංඛ්‍යාව දැඩි ලෙස උච්ඡාවචනය වන බව නිරීක්ෂණය වේ. එසේ නමුත්, විදේශීය කාර්මික සැලසුම් වලට සාපේක්ෂව දේශීය කාර්මික සැලසුම් ඉහළ ලියාපදිංචි වීමක් පෙන්නුම් කරයි. 2020 වසර වන විට නිරීක්ෂණය වන ඉතා අඩු විදේශීය කාර්මික සැලසුම් ලියාපදිංචි වීම් සංඛ්‍යාව රට තුළ උද්ගතව පවතින අයහපත් ආර්ථික තත්ත්වය මත විදේශීය නිර්මාණකරුවන්ගේ උනන්දුව හීන වී යාමක් බවට උපකල්පනය කළ හැකි ය.

2.4 විශේෂ ජයග්‍රහණ

- **වෙළඳ ලකුණු**

වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ පහසුකම් සපයන මැඩ්රිඩ් සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය වෙත අයදුම්කිරීමට හා බුද්ධිමය දේපළ පනතට අවශ්‍ය සංශෝධන කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබේ. ඒ අනුව සංශෝධිත යෝජනා ඇතුලත් පනත් කෙටුම්පත ආයතනයේ නිරීක්ෂණයන් සමඟ ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ නිරීක්ෂණයන් වෙත යොමු කර ඇති අතර, එකී නිරීක්ෂණයන් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- **පේටන්ට්**

2022 වර්ෂය අවසාන වන විට 2020 වසර දක්වා ලැබී තිබූ සියලු ම දේශීය පේටන්ට් අයදුම්පත්වල (2019 වසරේ අයදුම්පත් 2ක් හැර) ද්විතීයික පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට පේටන්ට් හා කාර්මික සැලසුම් අංශය සමත් වී ඇත.

- **ප්‍රකාශන හිමිකම්**

කර්තෘභාග අයිතිය සංගීත ක්ෂේත්‍රයේ කලාකරුවන් වෙත හිමි කර දීම සම්බන්ධයෙන් අවම ගාස්තු නියම කරන ලද අංක 2164/70 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව රියලිටි තරඟ වලදී ගැයෙන ගීත වල ප්‍රකාශන හිමිකම් වෙනුවෙන් කර්තෘභාග අය කරගැනීම හා සාමූහික සංගම් වෙත බැර කර ඇති මුදල් අදාළ කලාකරුවන් වෙත බෙදා හැරීම, ඇතුළු ආශ්‍රිත කරුණු පිළිබඳව අධ්‍යයනය සඳහා පත් කරන ලද කමිටුව විසින් ඒ හා සම්බන්ධ සාකච්ඡා පවත්වන ලද අතර, එකී කමිටුවෙහි අධ්‍යයන වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත.

- **භූගෝලීය දර්ශක**

<u>භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම</u>

භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා වන රෙගුලාසි නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා ආයතනය විසින් කෙටුම්පත් සකසමින් පවතී. 2022 වසරේ පත් කරන ලද බුද්ධිමය දේපළ උපදේශන කොමිසමේ අනුමැතිය ලැබුන පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතය.

- **තාක්ෂණික නවෝත්පාදන සහයෝගිතා මධ්‍යස්ථාන (TISC) ව්‍යාපෘතිය**

  පේටන්ට් හා තාක්ෂණික තොරතුරු සඳහා ප්‍රවේශය ලබා දීම අරමුණු කරගත් තාක්ෂණික නවෝත්පාදන සහයෝගිතා මධ්‍යස්ථාන (TISC) ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රවර්ධනය කරමින් සහ නිර්මාණ වාණිජකරණය (commercialization) අරමුණු කරගත් ව්‍යාපෘතියක් ලෙස ඉදිරි ගමනක් බලාපොරොත්තු වේ. එම අරමුණින් ව්‍යාපෘති වාර්තාව සංශෝධනය කිරීමට කටයුතු කර ඇත. අලුතින් අවබෝධතා ගිවිසුම් 04ක් ආයතන 04ක් සමඟ අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

- **බුද්ධිමය දේපළ වාණිජකරණයට පහසුකම් සැලැස්වීමේ ව්‍යාපෘතිය හෙවත් "Enabling Intellectual Property Environment Project"**

  විශ්ව විද්‍යාල හා පර්යේෂණ ආයතන මඟින් බිහිවන නව නිපැයුම් වාණිජකරණය කිරීමට අවශ්‍ය ධාරිතා සංවර්ධනය මූලික අරමුණ කරගෙන 2016 වර්ෂයේ දී ලෝක බුද්ධිමය දේපළ සංවිධානය හා එක්ව ආරම්භ කළ මෙම ව්‍යාපෘතියේ කටයුතු 2022 වර්ෂයේ දී සාර්ථක ලෙස අවසන් කරන ලදි. එහි ක්‍රියාකාරී වැඩසටහන් ලෙස 2017 හා 2020 වර්ෂවල දී සංවිධානය කරන ලද පේටන්ට් වාර්තා කෙටුම්පත් කිරීමේ වැඩමුළු 02 සහ පේටන්ට් පූර්වකලා පරීක්ෂා කිරීමේ වැඩමුළුව මඟින් පේටන්ට් පරීක්ෂක වරුන්ගේ මෙන්ම පර්යේෂකයින්ගේ ද ධාරිතා සංවර්ධනය සඳහා සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත. නව නිපැයුම් වාණිජකරණයට ලක්කිරීමට පහසුකම් සැලැස්වීම උදෙසා සංවිධානය කරන ලද තාක්ෂණ පැවරුම් පුහුණු වැඩසටහන් (05), ශිෂ්‍යත්ව වැඩසටහන් (06) සහ තාක්ෂණ පැවරුම් උපදේශකත්ව වැඩසටහන් (05) මෙම ව්‍යාපෘතියේ සාමාජිකත්වය දැරූ විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතනවල ධාරිතා සංවර්ධනය සඳහා විශේෂයෙන් උපකාරී වී ඇත.

- **2022 වසරේ පවත්වන්නට යෙදුන "හොඳම වාර්ෂික වාර්තාව - 2020" සම්මාන උළෙලේ දී දෙපාර්තමේන්තු වර්ගීකරණය යටතේ 2020 වාර්ෂික වාර්තාව සඳහා බුද්ධිමය දේපළ කාර්යාලය පළමු ස්ථානයට හිමි රන් සම්මානය දිනා ගැනීම.**



2.5 අභියෝග

- රට තුළ පැවති ගැටලුකාරී වාතාවරණය හේතුවෙන් නිලධාරින්ට සේවයට අඛණ්ඩව වාර්තා කිරීමේ ගැටලු අපහසුතාවයන් පැවතුනු අතර, සීමිත පැමිණීම හා මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කරමින් ප්‍රශස්ත සේවාවක් ලබාදීමට කටයුතු කරන ලදී.

- නිවසේ සිට රාජකාරි කටයුතු වඩා කාර්යක්ෂම හා නිවැරදි ආකාරයෙන් සිදු කිරීම සඳහා විද්‍යුත් පද්ධතියක් (e- system) වෙළඳ ලකුණු අංශය සතුව නොමැතිවීම අභියෝගයක් වූ අතර, විද්‍යුත් තැපෑල හා "එනි ඩෙස්ක්" ක්‍රමය (Any Desk) භාවිතා කරමින් වෙළඳ ලකුණු අංශයේ කාර්යයන් අඛණ්ඩව සිදු කරගෙන යන ලදී.

- වෙළඳ ලකුණු අංශයෙහි ලිපි ගොනු ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ලේඛනාගාර පහසුකම් නොමැති වීම හේතුවෙන් ලිපිගොනු ක්‍රමවත්ව ගබඩා කිරීමේ ගැටලු පැවති අතර, කාලය ඉකුත් වීමෙන් පසු නැවත අලුත් කිරීම් නොකරන ලද හා විවිධ හේතු මත ලේඛනාගාරයෙන් ඉවත් කිරීමට හැකි ලිපි ගොනු ඉවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් යම් ආකාරයකට ලේඛනාගාරයේ ඉඩ පහසුකම් සලසා ගැනීමට කටයුතු කරන ලදී .

- ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් කාර්ය භාරයක් ඉටු කරනු ලබන වෙළඳ ලකුණු අංශයේ හා පේටන්ට් අංශයේ දැනට පවතින සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම.

- වෙළඳ ලකුණු අංශය සඳහා එක් මසකට 1000කට ආසන්නවූ වෙළඳ ලකුණු අයදුම්පත් ලැබෙන අතර, වෙළඳ ලකුණු පරීක්ෂා කිරීම, වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම හා අලුත් කිරීම හා ඒ අතර වූ සංකීර්ණ ක්‍රියාවලියෙහි සියලු කාර්යයන් අධ්‍යක්ෂ (නීති), සහකාර අධ්‍යක්ෂ (නීති) නිලධාරින් තිදෙනෙකු, බුද්ධිමය දේපළ නිලධාරින් පස් දෙනෙකු, සංවර්ධන නිලධාරින් දොළොස් දෙනෙකු හා කාර්යාල සේවක සේවයේ නිලධාරින් දෙදෙනෙකුගෙන් සමන්විත සීමිත වූ කාර්ය මණ්ඩලයක් විසින් සිදු කරන ලදී.

2.6 ඉදිරි ඉලක්ක

- පේටන්ට් පරීක්ෂාවක් සම්බන්ධව වැය කරනු ලබන කාලය (නවතාවය පිළිබඳ පරීක්ෂාව) මාස 08ක කාලයක් දක්වා අවම කිරීම.

- මාර්ගගත ක්‍රමයට අයදුම්පත් ගොනු කිරීමේ අවස්ථාව සහ අනෙකුත් ගොනු කිරීම් මාර්ගගත ක්‍රමයට සිදු කිරීම සඳහා පහසුකම් ජනතාව වෙත ලබා දීම.

- ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ඇතුළත් මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීම.

- භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ පහසුකම් සැලසීම .

  භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා බුද්ධිමය දේපළ පනත සංශෝධනය (2022 අංක 08) කිරීම 2022 පෙබරවාරි මස සිදුවූ අතර, ඒ සඳහා වූ රෙගුලාසි නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කිරීමෙන් පසුව භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ පහසුකම ලබාදීමට හැකි වනු ඇත.

- ප්‍රකාශන හිමිකම් වෙනුවෙන් කර්තෘභාග ගෙවීම ප්‍රමිතිකරණ හා නියාමනය කිරීම.

  මෙය අධ්‍යයනය සඳහා පත් කරන ලද කමිටුව විසින් ඒ හා සම්බන්ධ සාකච්ඡා පවත්වන ලද අතර, එකී කමිටුවෙහි අධ්‍යයන වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර, එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් කර්තෘභාග ගෙවීම ප්‍රමිතිකරණය සඳහා යොමු වීම.

- ප්‍රකාශන හිමිකම් පිළිබඳව කටයුතු කිරීම සඳහා වෙනම අංශයක් ස්ථාපිත කිරීම.

  මේ සඳහා ශක්‍යතා අධ්‍යනය 2023 වර්ෂයේ දී සිදු කිරීමට අපේක්ෂිතය.

3. වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.අ	• බුද්ධිමය දේපළ අරමුදල
3.ආ	• ගීර්ෂය 299

3. (අ) වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය - බුද්ධිමය දේපළ අරමුදල

3. (අ) 1 මූල්‍ය ප්‍රකාශන - බුද්ධිමය දේපළ අරමුදල

බුද්ධිමය දේපළ අරමුදල

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන්	2022.12.31	2021.12.31
		රු.	රු.
අයභාරය			
වෙළඳ ලකුණු ආදායම	3	69,809,906	70,271,480
පේටන්ට් ආදායම	3	7,297,882	6,951,459
කාර්මික සැලසුම් ආදායම	3	466,230	561,207
වෙනත් ආදායම්	4	397,737	381,176
ආයෝජන පොලී ආදායම්	5	161,614,335	43,062,272
මුළු අයභාරය		**239,586,090**	**121,227,595**
වියදම්			
වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ	2	3,355,950	2,443,119
ප්‍රදාන හා වෙනත් හුවමාරු ගෙවීම්	2	2,329,763	1,263,585
සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය	2	50,982,250	40,956,811
වෙනත්	2	286,983	529,177
ක්ෂය සහ ක්‍රම ක්ෂය	2	8,064,032	7,212,801
මුළු වියදම්		**65,018,978**	**52,405,494**
කාල පරිච්ඡේදය සඳහා වූ අතිරික්තය/(ඌනතාවය) /අයභාරය		**174,567,112**	**68,822,100**

2 | Page

බුද්ධිමය දේපළ අරමුදල
2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2022.12.31	2021.12.31
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන විෂයයන්	8	9,246,872	2,411,558
ලිපි ද්‍රව්‍ය ඉතිරි තොගය	1	5,419,136	-
ලැබිය යුතු ආදායම්	9	19,959,330	31,387,410
කෙටි කාලීන ආයෝජන	7	1,076,609,446	898,540,693
ඉදිරියට කළ ගෙවීම්	11	311,519	5,345
		1,111,546,304	932,345,005
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	6	28,966,553	31,460,226
ලැබිය යුතු ප්‍රතිපූර්ණය කිරීම් - බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන		22,298,751	22,298,751
		51,265,304	53,758,977
මුළු වත්කම්		1,162,811,608	986,103,982
බැරකම්			
ජංගම බැරකම්			
උපචිත වියදම්	12	3,262,384	3,816,701
ජංගම නොවන බැරකම්		-	-
මුළු බැරකම්		3,262,384	3,816,701
ශුද්ධ වත්කම්		1,159,549,224	982,287,281
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
සමුච්චිත අතිරික්තය / ඌණතාවය	10	1,159,549,224	982,287,281
ශුද්ධ වත්කම්/ස්කන්ධය		1,159,549,224	982,287,281

ආර්.පී.එස්. රාජපක්ෂ
ගණකාධිකාරී

ගීතාංජලී ආර්. රණවක
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්

ආර්.පී.එස්. රාජපක්ෂ
ගණකාධිකාරී
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
සමාගම් මැදුර, 3වන මහල,
400, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.

ගීතාංජලී ආර්. රණවක
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
3 වන මහල, "සමාගම් මැදුර"
අංක: 400, ඩී.ආර්. විජයවර්ධන මාවත,
කොළඹ 10

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආ.ක්‍ර.ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව බුද්ධිමය දේපළ අරමුදලේ ගණන් විගණනය කිරීමේ කාර්යය සඳහා 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතෙහි 176 (5) වගන්තිය අනුව සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශය 2023.02.27. දින අනුමත කරන ලදි.

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු
ලේකම්
වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
2023-02-27

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු.
ලේකම්
වෙළෙඳ, වාණිජ හා
ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

බුද්ධිමය දේපළ අරමුදල

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

සෘජු ක්‍රමය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2022.12.31	2021.12.31
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	රු.	රු.
ලැබීම්		
බදු	3,600	2,925
භාණ්ඩ හා සේවා විකිණීමෙන්	116,361,027	116,676,219
පොලි ලැබීම්	173,042,415	20,504,224
අනෙකුත් ලැබීම්	711,520	782,372
ගෙවීම්		
සේවක පිරිවැය	(3,351,958)	(2,469,733)
සැපයුම්කරුවන්ට ගෙවීම්	(54,207,878)	(43,625,775)
අනෙකුත් ගෙවීම්	(2,617,875)	(1,757,472)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**229,940,852**	**90,112,760**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්		
පිරියත හා උපකරණ මිලදී ගැනීම	(6,098,664)	(3,628,840)
පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබීම්	16,188	-
ආයෝජන කල්පිරීමෙන් ලැබීම්	3,712,934,285	895,641,676
ආයෝජන මිලදී ගැනීම්	(3,891,003,038)	(942,540,602)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(184,151,229)**	**(50,527,766)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්		
බදු මුදල් ආපසු ගෙවීම්	-	-
රජයට බෙදාහැරීම්	(38,954,309)	(39,059,989)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(38,954,309)**	**(39,059,989)**
මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩි වීම/ (අඩුවීම)	6,835,314	525,005
2022.01.01 දිනට මුදල් හා මුදල් හා සමාන දෑ	2,411,558	1,886,552
2022.12.31 දිනට මුදල් හා මුදල් හා සමාන දෑ	**9,246,872**	**2,411,558**

බුද්ධිමය දේපළ අරමුදල

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රදවාගත් ලාභය/ අලාභය	වෙනත් සංචිත	එකතුව
	රු.	රු.	රු.	රු.
2021.01.01 දිනට ශේෂය	909,874,631	-	-	909,874,631
පූර්ව වර්ෂ ගැලපුම්	-	3,590,550	-	3,590,550
ප්‍රත්‍යාගණන ලාභය	(5,578,250)	-	5,578,250	-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	68,822,100	-	68,822,100
2021.12.31 දිනට ශේෂය	**904,296,381**	**72,412,650**	**5,578,250**	**982,287,281**
2022.01.01 දිනට ශේෂය	976,709,031	-	5,578,250	982,287,281
පූර්ව වර්ෂ ගැලපුම්	-	2,694,831	-	2,694,831
ප්‍රත්‍යාගණන ලාභය	-	-		-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	174,567,112	-	174,567,112
2022.12.31 දිනට ශේෂය	**976,709,031**	**177,261,943**	**5,578,250**	**1,159,549,224**

අවසාන ගිණුම් සඳහා අදාළ වන ගිණුම් සටහන්

මූලික ගිණුම් ප්‍රතිපත්ති සහ ප්‍රකාශන

- 2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.
- මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.
- •ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් පිළියෙල කර ඇත.
- මූල්‍ය වාර්තා සකස් කිරීමේ දී පදනම් කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සංකල්පය වේ. මෙම ගිණුම් ඉදිරිපත් කිරීමේ දී උද්ධමනය සඳහා ගැලපුම් කර නොමැත.
- ද්‍රව්‍යාත්මක බව, ඒකාකාරී බව හා අඛණ්ඩ පැවැත්ම, උපචිත පදනම් පිළිබඳ සංකල්පය පදනම් කර ගිණුම් ඉදිරිපත් කර ඇති අතර එහි දී යථායෝග්‍යතාව පිළිබඳ සැලකිල්ලක් දක්වා ඇත.
- වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්ති
- ස්ථාවර වත්කම් සරල මාර්ග ක්ෂය පදනම මත වත්කම් වල ඵලදායී ජීවිත කාලය පුරා ක්ෂය කරනු ලැබේ..

  වත්කම් ක්ෂය කිරීමේ අනුපාත.

කාර්යාල උපකරණ	10%
කාර්යාල සවි කිරීම්	10%
ලී බඩු හා උපකරණ	05%
මෝටර් රථ	10%
තිර රෙදි	20%
පොත් පත්	10%
පරිගණක	25%

- ආයෝජනයන් ඒවායේ මුහුණත අගය හා පිරිවැය යන අගයන් දෙකෙන් අඩු අගයට ගිණුම් ගත කර ඇත.
- උපචිත වියදම් 2023 පෙබරවාරි මස 23 දින දක්වා ගණනය කර ඇත.
- 2022.12.31 දිනට ඉතිරි ලිපිද්‍රව්‍ය තොගය රු. 5,419,136 කි.
- සේවා සැපයීම වෙනුවෙන් ගිණුම් වර්ෂයට අදාලව ලැබෙන ආදායම, ගිණුම් වර්ෂයට අදාළ ව හඳුනා ගන්නා අතර ආයෝජන වෙනුවෙන් ලැබෙන ආදායම කාලයට සමානුපාතික ක්‍රමයකට අනුව ගිණුම් ගත කර ඇත.
- බුද්ධිමය දේපළ අරමුදල පරිපාලනය කිරීමේ කටයුතු වෙනුවෙන් බුද්ධිමය දේපළ කාර්යාලයේ නිලධාරීන් සඳහා ගෙවනු ලබන වැටුප් හා දීමනා ඇතුළු අයහාර වියදම් සඳහා රු. 46,245,955 ක මුදලක් විසර්ජන වැය ශීර්ෂය 299 යටතේ රජය විසින් දරනු ලැබ ඇත.

❖ අංක අමප/15/0272/625/007 හා 2015.04.23 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් බුද්ධිමය දේපළ ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීමට වැය කළ මුදල්, නාගරික සංවර්ධන අධිකාරියෙන් අය කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2015.04.23 දින ලැබී ඇත. එය අනුව අදාළ මුදල් ප්‍රතිපූරණය කරන මෙන්, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීම් කර තිබේ.

❖ බුද්ධිමය දේපළ අරමුදලට විරුද්ධව පැවරූ කිසිදු නඩුවක් නැත. බුද්ධිමය දේපළ කාර්යාලය ප්‍රධාන අවස්ථා දෙකක දී බුද්ධිමය දේපළ විෂයයට අදාලව පාර්ශවකරුවෙක් ලෙස නම් කරනු ලැබේ.

i. බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගන්නා ලද බුද්ධිමය දේපළ විෂයයට සම්බන්ධ ඒක - පාර්ශවීය තීරණවලට, විශේෂයෙන් වෙළඳ ලකුණු අයදුම්පත් සම්බන්ධ තීරණවලට එරෙහිව කොළඹ මහාධිකරණයට අයදුම්කරුවන් විසින් අභියාචනා කිරීම.

ii. වෙළඳ ලකුණු අයදුම්පත් සම්බන්ධ විරෝධතා ගොනු කිරීමක දී බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගනු ලබන තීරණයකට එරෙහිව අදාල පාර්ශව විසින් කොළඹ මහාධිකරණයට අභියාචනා කිරීම.

❖ ශේෂ පත්‍ර දිනට පසුව සිදුවීම් නොමැත.

❖ සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු සිදුකර නොමැත.

3. (අ) 2 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය - (බුද්ධිමය දේපළ අරමුදල)

(රු.000)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදනය		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	75,302	75,302	65,018	86.3%
ප්‍රාග්ධන	9,600	9,600	3,034	31.6%

3.(අ) 3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් (බුද්ධිමය දේපළ අරමුදල)


පරිත්‍යාග කළ ආයතනය	පරිත්‍යාගයේ අරමුණ	පරිත්‍යාග මුදල
-	-	-

3.(අ) 4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය (බුද්ධිමය දේපළ අරමුදල)

(රු.000)

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට හාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021දින ට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ-අරමුදල	4,281	4,281	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරී ගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3. (අ) 5 විගණකාධිපතිවරයාගේ වාර්තාව - බුද්ධිමය දේපළ අරමුදල



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } විඑඩි/ඒ/අයිපිඕඑන්/එන්එස්/22/ ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 25 දින

NATIONAL INTELLECTUAL P
06 JUN 2023
Accounts Branch

බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපල කාර්යාලය

බුද්ධිමය දේපල අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බුද්ධිමය දේපල අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු. 6,330,865 ක් වූ දේපළ පිරියත සහ උපකරණ දැනටමත් භාවිතයට ගනිමින් පැවතියද ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එසේම ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. 03 ප්‍රකාරව මෙකී වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව ඇස්තමේන්තුගත දෝෂය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි ඉපැත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා

ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 සහ 2022 දෙසැම්බර් 20 දිනැති අංක 01/2020 (ii) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සේවා සම්පාදනය සඳහා අයකරන ගාස්තු ඉහල නංවා නොමැති සියලුම රාජ්‍ය ආයතන ගාස්තු සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතු වුවද, ගාස්තු සංශෝධනය කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගෙන ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කර නොනිබුණි.

3.2 ආයෝජන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අරමුදල් ගිණුමේ අනුගාමී මාස 4ක් තුළ රු. මිලියන 10 ක සිට රු. මිලියන 15 ක් අතර පරාසයක ශේෂයක් පැවති අතර අතිරික්ත මුදල් ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කර නොතිබුණි.

3.3 කාර්යසාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා 431 දෙනෙකු ඉල්ලුම් කර තිබූ අතර 2023 අප්‍රේල් 30 දින වන විට ඉන් පේටන්ට් බලපත්‍ර 5ක් පමණක් නිකුත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම සඳහා ලද ඉල්ලුම්පත්‍ර 9465 කින් ඉල්ලුම්පත්‍ර 531 ක් එනම් සියයට 5.6 ක් පමණක් ප්‍රාථමික හා ද්විතීක පරීක්ෂාවට ලක් කිරීම පමණක් සිදු කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී සිදුකල වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම් 3640 කින් ලියාපදිංචි කිරීම් 555 ක් 2011 වර්ෂයට පෙර ලද ඉල්ලුම්පත් වලින් වූ අතර, පනතේ 118(1) හා (2) වගන්ති ප්‍රකාරව ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ දින සිට වර්ෂ 10 ක කාලයක් බලපත්‍රය වලංගු වන බැවින් වෙළඳ ලකුණු ලියාපදිංචිය සිදුවන අවස්ථාව වන විටත් බලපත්‍රයේ වලංගුතාවයක් නොපැවතුණි.

(ඈ) හේග් ජාත්‍යන්තර ගිවිසුමට ඇතුළත්වීමට 2019 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා වූ වර්ෂ 04 ක් තුල ව්‍යාපෘති අධ්‍යනයක් කර ඇතත්, එම ගිවිසුමට එළඹීමෙන් ශ්‍රී ලංකාවට ඇති වන වාසිදායක තත්වය පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතු බව හඳුනාගෙන ඇතත් එසේ කර නොතිබුණි.

(ඉ) අරමුදලේ මුලු අයභාරය වූ රු.239,586,090 කින් රු.161,614,335 ක් එනම් සියයට 67ක් ආයෝජන පොලී ආදායමින් සමන්විත වී තිබුණි.

3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කර ඇති මුදල් රෙගුලාසි 877 හි (2) (ඉ) ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2023 අප්‍රේල් 30 දින වන විට 2019 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පමණක් පාර්ලිමේන්තු සභාගත කර තිබුණි.

3.5 වෙනත් කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩමේ අයිතිය පවරා ගැනීමකින් තොරව බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රු.22,298,751 ක මුදලක් වියදම් කර තිබියදී ඒ ආශ්‍රිත ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත්කරගෙන තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වැය කළ මුදල සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර ගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) 2019 වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබූ රු.273,083 ක වැටි බදු මුදල් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි.


(ඇ) භූගෝලීය දර්ශක ලියාපදිංචිය සඳහා වූ රෙගුලාසි අනුමත කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේදීද එම ඉල්ලුම්පත් ලියාපදිංචි කිරීමේ කාර්යයන් ආරම්භ කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

3.(ආ). මූල්‍ය කාර්යසාධනය - ශීර්ෂය 299

3. (ආ).1. මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශය - ශීර්ෂය 299



ඒසිඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තක්සේරු 2022 රු.	නැවත ගලපන ලද 2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
47,645,000	භාණ්ඩාගාර අග්‍රිම		46,540,000	42,940,000	ඒසිඒ-3
-	තැන්පතු		77,846	22,475	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		4,951,624	5,246,604	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
47,645,000	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		51,569,470	48,209,079	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		51,569,470	48,209,079	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		888	4,775	
